# පඨමො පාඨො

# සච්චවාදී

පුබ්බෙ ලඞ්කායං පච්චන්තගාමො අහොසි. තස්මිං ගාමෙ සච්චවාදී එකො දාරකො විහාසි. මාතාපිතරො තස්ස තිස්සො'ති නාමං අකංසු. තිස්සො කදාචි මුසා න භණි. තිස්සස්ස ගෙහඞ්ගණෙ නානා කුසුමගච්ඡා අහෙසුං. සො දාරකො සහායකෙහි දාරකෙහි සද්ධිං අත්තනො අඞ්ගණෙ කන්දුකකීළං කීළි. තදා තිස්සෙන දින්නකන්දුකපහාරෙන එකො කුසුමගච්ඡො භින්නො. සායණ්හෙ තස්ස මාතා ඡින්නභින්නසාඛං කුසුමගච්ඡං දිස්වා දාසං පක්කොසාපෙත්වා රෙ! කෙන අයං අපරාධො කතො'ති පුච්ඡි. භීතො සො දාසො අහං න ජානාමී'ති අවදි. තිස්සස්ස මාතා තං න සද්දහි. තස්මා දාසං තජ්ජෙත්වා පහරිතුං වායමි. තස්මිං ඛණෙ තිස්සො සම්පාපුණි. සො තං දිස්වා මාතුයා සන්තිකං ගන්ත්වා එවමාහ. අම්ම, මා දාසං පහරි. තං මෙ වජ්ජං. එසො මම කම්මො. න දාසස්ස දොසො. තස්මා අහං දණ්ඩනීයො භවාමි. තං සුත්වා මාතා අතී'ව පසන්නා තිස්සස්ස සීසං පරිමද්දිත්වා එකං චාගම්පි අදාසි.

(පාලි රචනා 1)

පද මාලාව

| | | | |
|---|---|---|---|
| පච්චන්තගාමො | (ස) | - | පිටිසර ගමක් |
| සච්චවාදී | (ත) | - | ඇත්ත කියන්නා/ සත්‍යවාදී |
| විහාසි | (ක්‍රි) | - | වාසය කළේය |
| මාතාපිතරො | (ස) | - | මවුපියෝ |
| අකංසු | (ක්‍රි) | - | කළහ |
| මුසා | (නි) | - | බොරු |
| භණි | (ක්‍රි) | - | කීවේය |
| ගෙහඞ්ගණෙ | (ස) | - | ගෙහි මිදුලේ |
| නානා | (නි) | - | නොයෙක් |
| කුසුමගච්ඡා | (ස) | - | මල් පඳුරු |
| අහෙසුං | (ක්‍රි) | - | වූහ |
| කන්දුකකීළං | (ස) | - | පන්දු ක්‍රීඩාව |
| කීළි | (ක්‍රි) | - | කෙළියේය/ක්‍රීඩා කළේය |
| කන්දුකපහාරෙන | (ස) | - | බෝල පහරකින් |
| භින්නො | (කි) | - | බිඳුණු |
| සායණ්හෙ | (නි) | - | සවස |
| ඡින්න | (කි) | - | සිඳුණු |

| | | | |
|---|---|---|---|
| සාඛං | (නා) | - | අත්ත |
| පක්කොසාපෙත්වා | (පූ.ක්‍රි) | - | කැඳවවා |
| ජානාමි | (ක්‍රි) | - | දනිමි |
| අවදි | (ක්‍රි) | - | කීවේය |
| සද්දහි | (ක්‍රි) | - | විශ්වාස කළේය |
| වායමි | (ක්‍රි) | - | උත්සාහ කළේය |
| පහරි | (ක්‍රි) | - | ගැසුවේය |
| අතීව | (සං) | - | අතිශයින් ම |
| පසන්නා | (කි) | - | පැහැදුණු තැනැත්තී |
| තජ්ජෙත්වා | (පූ.ක්‍රි) | - | තර්ජනය කොට |
| වජ්ජං | (නා) | - | වරද |
| දණ්ඩනීයො | (ත) | - | දඬුවම් ලැබිය යුත්තා |
| පරිමද්දිත්වා | (පූ.ක්‍රි) | - | අතගා/ පිරිමැද |
| චාගම්පි | (සං) | - | තෑග්ගක් ද |
| අදාසි | (ක්‍රි) | - | දුන්නේය |

**අභ්‍යාස**

1. 'සච්චවාදී' ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. සො දාරකො කිං වාදී හොති?
ii. ගෙහඞ්ගණෙ කෙ අහෙසුං?
iii. කස්මා මාතා දාසං පක්කොසාපෙත්වා තජ්ජෙසි?
iv. පච්ඡා තිස්සො කිං අභාසි?
v. මාතා කස්ස චාගං අදාසි?

**අක්ෂර මාලාව**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඉ | ඊ | උ | ඌ | එ | ඔ |
| | ක | ඛ | ග | ඝ | ඞ | | |
| | ච | ඡ | ජ | ඣ | ඤ | | |
| | ට | ඨ | ඩ | ඪ | ණ | | |
| | ත | ථ | ද | ධ | න | | |
| | ප | ඵ | බ | භ | ම | | |
| | ය | ර | ල | ව | | | |
| | ස | හ | ළ | (අ)ං | | | |


නොමිලේ බෙදා හැරීම පිණිසයි

පාලි හෝඩිය අකුරු 41 කින් යුක්ත ය. **(අක්ඛරාපාදයො එකචත්තාළීසං)**

**අක්‍ෂර ප්‍රභේද**

'ඕ' කාරය අවසන් කොට ඇති අකුරු අට (8) ස්වර නම් වේ. **(තත්‍ථොදන්තා සරා අට්ඨ)**

ස්වර හැරුණු විට නිග්ගහීතය අවසන් කොට ඇති ඉතිරි අකුරු තිස්තුන (33) **ව්‍යඤ්ජන** නම් වේ. **(සෙසා බ්‍යඤ්ජනා)**

**1. ස්වර ප්‍රභේද**

පාලි භාෂාවේ ස්වර උච්චාරණය සඳහා ගතවන කාලය අනුව **හ්‍රස්ව** හා **දීර්ඝ** යනුවෙන් ප්‍රභේද දෙකකට බෙදේ.

**හ්‍රස්ව ස්වර**

එක් මාත්‍රාවක දී උච්චාරණය කළ හැකි ස්වර **හ්‍රස්ව ස්වර** නම් වේ. එබඳු ස්වර තුනකි. **(අ, ඉ, උ ඉති තයො රස්සා)**

**අ, ඉ, උ**

**දීර්ඝ ස්වර**

උච්චාරණය සඳහා එක් මාත්‍රාවකට වැඩි කාලයක් ගතවන ස්වර **දීර්ඝ ස්වර** නම් වේ. එබඳු ස්වර පහක් පාලි වර්ණ මාලාවේ ඇත. **(අඤ්ඤෙ දීඝා)**

**ආ, ඊ, ඌ, ඒ, ඕ**

**2. ව්‍යඤ්ජන ප්‍රභේද**

ව්‍යඤ්ජනාක්‍ෂරයන්ගේ වර්ග, අවර්ග, වර්ගාන්ත ආදි බෙදීම් හැරුණු විට දක්නට ලැබෙන ප්‍රධාන බෙදීමක් වන්නේ **ඝෝෂ** හා **අඝෝෂ** භේදය යි.

**අඝෝෂාක්‍ෂර**

උච්චාරණයේ දී අඩු ශබ්දයක් සහිත ව කියවෙන අකුරු **අඝෝෂ** නම් වේ. වර්ගාක්‍ෂරවල පළමු වන සහ දෙවන අකුරුත් **සකාරයත්** යන අකුරු එකොළහ (11) **අඝෝෂ** නම් වේ. **(වග්ගානං පඨමදුතියා සොචාඝොසා)**

**ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ, ප, ඵ, ස**

**ඝෝෂාක්ෂර**

උච්චාරණයේ දී අඝෝෂ අක්ෂරවලට වඩා වැඩි හඬකින් කියවෙන අකුරු ඝෝෂ නම් වේ. ව්‍යඤ්ජන අකුරුවල **අඝෝෂ** අකුරු සහ **නිග්ගහීතය** (බින්දුව) හැරුණු විට ළකාරයෙන් අවසන් වන ඉතිරි අකුරු විසිඑක (21) **ඝෝෂාක්ෂර** වේ. **(ළනතාගෝඤ්ඤ ඝොසා)**

| | | | |
|---|---|---|---|
| ග, | ඝ, | ඞ | |
| ජ, | ඣ, | ඤ | |
| ඩ, | ඪ, | ණ | |
| ද, | ධ, | න | |
| බ, | භ, | ම | |
| ය, | ර, | ල, | ව |
| හ, | ළ | | |

**අභ්‍යාස**

1. පාලියෙහි වර්ණ මාලාව පිළිවෙළින් ලියා දක්වන්න.

2. අඝෝෂ හා ඝෝෂාක්ෂර එනමින් හැඳින්වීමට හේතු දක්වා, එම අකුරු වෙන වෙන ම ලියා දක්වන්න.

3. පහත සඳහන් වචනවල ආරම්භක අකුර පමණක් සලකා **අඝෝෂ** හා **ඝෝෂවලට** බෙදා දක්වන්න.

i. කලන්දකො
ii. වානරො
iii. පත්තං
iv. දෙවො
v. කුක්කුටො
vi. ඵලං
vii. ඛුරං
viii. වනිතා
ix. ඡත්තං
x. සිසෙසා
xi. මාලා
xii. ඝොසජී
xiii. යොගි
xiv. තොයං

4. සිංහලට නගන්න.

i. බුද්ධො
ii. ආචරියො
iii. සිසෙසා
iv. සාලා
v. අක්ඛරං
vi. පොත්ථකං
vii. ලෙඛනං
viii. පීඨං
ix. පාඨං
x. පරිවෙණං

5. සිංහලට නගන්න.

i. ආචරියො ලිඛති.
ii. සිසෙසා උගගණ්හාති.
iii. භික්ඛු ධම්මං දෙසෙති.
iv. සො පීඨෙ නිසීදති.
v. අහං පාඨං පඨාමි.

6. පාලියට නගන්න.

i. අපි පිරිවෙණට යමු.
ii. මට පෑනක් (ලෙඛනී) දෙන්න.
iii. නුඹලා බුදුන් පුදව්.
iv. ළමයා සෙල්ලම් කරයි.
v. ඔහු ගස කපයි.